අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/17/02/HE.CO(2025)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2025.04. 11

**චක්‍රලේඛ අංක:18/2025**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම විදුහල්පතිවරුන්

**ගෘහ ආර්ථික විද්‍යාව කුසලතා සංවර්ධන තරගාවලිය**

10 සහ 11 ශ්‍රේණිවල ඉගෙනුම ලබන ගෘහ ආර්ථික විද්‍යාව විෂයයක් ලෙස හදාරන සිසු සිසුවියන්ගේ න්‍යායයික, ප්‍රායෝගික, පර්යේෂණ හා නිර්මාණ හැකියා සංවර්ධනය කිරීම උදෙසා කුසලතා සංවර්ධන තරගාවලියක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශයේ තාක්ෂණ අධ්‍යාපන ශාඛාව මගින් වාර්ෂිකව පවත්වනු ලැබේ. ඒ අනුව මෙම තරග පාසල්, කොට්ඨාස, කලාප සහ පළාත් මට්ටමින් පැවැත්වීමට කටයුතු යෙදිය යුතුය. පළාත් මට්ටමින් ජයග්‍රහණය ලබන සිසුන් ජාතික මට්ටමට ඉදිරිපත් කළ යුතු වේ. (2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ යුතුය.)

**1. අභිමතාර්ථ**

1. ආහාර හා පෝෂණය පිළිබඳ ශිෂ්‍ය ප්‍රවීණතාව සංවර්ධනය කිරීම
2. රෙදිපිළි තාක්ෂණය පිළිබඳ ශිෂ්‍ය ප්‍රවීණතාව සංවර්ධනය කිරීම
3. ළමා සංවර්ධනය පිළිබඳ ශිෂ්‍ය ප්‍රවීණතාව සංවර්ධනය කිරීම
4. ගෘහ කළමනාකරණය පිළිබඳ ශිෂ්‍ය ප්‍රවීණතාව සංවර්ධනය කිරීම
5. ප්‍රායෝගික ජීවන කුසලතා සංවර්ධනය කිරීම
6. සම්පත් කළමනාකරණය සඳහා නව්‍ය ප්‍රවේශයන් දිරිමත් කිරීම
7. දේශීය අමුද්‍රව්‍යවල තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම
8. සාම්ප්‍රදායික ඉවුම් පිහුම් ක්‍රම හා දේශීය ආහාර භාවිතය සහ ආහාර සුරක්ෂිතතාවය සඳහා යොමු කිරීම
9. ආගන්තුක සත්කාර හා ආහාර පිළිගැන්වීමේ කලාව ප්‍රගුණ කිරීම
10. පර්යේෂණ මත පදනම් වූ ප්‍රවේශයන් දිරිමත් කිරීම
11. සිසුන්ගේ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය කිරීම හා රැකියා වෙළෙඳපොළට පිවිසීමට අවස්ථා උදාකර දීම
12. සිසුන්ගේ න්‍යායාත්මක දැනුම සංවර්ධනය කිරීමට අවස්ථාව ලබා දීම

**2. තරග සඳහා උපදෙස්**

- තරග සඳහා ඉදිරිපත් විය හැක්කේ 10 සහ 11 ශ්‍රේණිවල ගෘහ ආර්ථික විද්‍යාව විෂයය හදාරන සිසු සිසුවියන්ට පමණි.
- සෑම තරගයකම අභිමතාර්ථ, කොන්දේසි හා ලකුණු ක්‍රමය සිසුන්ට පැහැදිලි කළ යුතුය.
- තරග සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

**2.1 පවත්වන තරග කාණ්ඩ**

1 කාණ්ඩය - ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය
2 කාණ්ඩය - පර්යේෂණ ව්‍යාපෘති
3 කාණ්ඩය - නවෝත්පාදන

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

## 3. සිසුන් තෝරා ගැනීම

### 3.1 පාසල් මට්ටමින් සිසුන් තෝරා ගැනීම

**1 කාණ්ඩය - ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය**

පාසලේ ගෘහ ආර්ථික විද්‍යාව විෂයය හදාරන සිසුන්ගෙන් 10 ශ්‍රේණියේ පළමු වාර පරීක්ෂණයේ ලබාගත් ලකුණු මත වැඩිම ලකුණු ලැබූ සිසුන් පහත පරිදි කොට්ඨාස මට්ටමේ තරග සඳහා ඉදිරිපත් කළ යුතුය.

| ගෘහ ආර්ථික විද්‍යාව ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව | කොට්ඨාස මට්ටමේ තරග සඳහා තෝරා ගත යුතු සංඛ්‍යාව |
|---|---|
| 01 - 05 | 1 |
| 06 - 10 | 2 |
| 11 - 20 | 3 |
| 21 - 30 | 4 |
| 31 හෝ ඊට වැඩි | 5 |

**2 කාණ්ඩය - පර්යේෂණ ව්‍යාපෘති**

ගෘහ ආර්ථික විද්‍යාව විෂයය හදාරන 10 සහ 11 ශ්‍රේණිවල පර්යේෂණ ඉදිරිපත් කරන සියලුම සිසුන්ට මේ සඳහා ඉදිරිපත් විය හැකිය. එම සිසුන් සියලු දෙනා කොට්ඨාස මට්ටමේ තරග සඳහා ඉදිරිපත් කළ යුතුය.

**3 කාණ්ඩය - නවෝත්පාදන**

ගෘහ ආර්ථික විද්‍යාව විෂයය හදාරන 10 සහ 11 ශ්‍රේණිවල නවෝත්පාදන ඉදිරිපත් කරන සියලුම සිසුන්ට මේ සඳහා ඉදිරිපත් විය හැකිය. එම සිසුන් සියලු දෙනා කොට්ඨාස මට්ටමේ තරග සඳහා ඉදිරිපත් කළ යුතුය. කොට්ඨාස මට්ටමට ඉදිරිපත් කිරීමට පෙර පාසල් මට්ටමේ දී සිසුන් සියලු දෙනාගේම නවෝත්පාදනයෙහි නිර්මාණ සිදුකරන අවස්ථා ඡායාරූප මගින් තහවුරු කර කොට්ඨාස මට්ටමට ඉදිරිපත් කළ යුතුය. ශිෂ්‍ය නවෝත්පාදනය පාසලේ විෂයය භාර ගුරුවරයාගේ නිර්දේශය සහිතව විදුහල්පති සහතික කිරීමෙන් එම ව්‍යාපෘතිය සිසුවාගේ බවට සනාථ කර ඉදිරිපත් කළ යුතුය.

මෙම කාණ්ඩය උපකාණ්ඩ දෙකකට බෙදේ.

i. කේවල උපකාණ්ඩය
ii. කණ්ඩායම් උපකාණ්ඩය (උපරිම සිසුන් 03කට යටත්ව)

කේවල උපකාණ්ඩය යටතේ ඉදිරිපත් කරන තරග අයිතම සියල්ලමද කණ්ඩායම් උපකාණ්ඩය යටතේ ඉදිරිපත් කරන තරග අයිතම සියල්ලමද තෝරා කොට්ඨාස මට්ටමට ඉදිරිපත් කළ යුතුය.

### 3.2 කොට්ඨාස මට්ටමින් සිසුන් තෝරා ගැනීම.

**1 කාණ්ඩය - ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය**

පාසල් මට්ටමින් තෝරා යොමු කරන සිසුන් සියලු දෙනාම කොට්ඨාස මට්ටමින් ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු අතර වැඩිම ලකුණු ලබා ගත් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් සිසුන් තිදෙනා කලාප මට්ටමට ඉදිරිපත් කළ යුතුය. යම් අවස්ථාවක සම ලකුණු ලබා ගත් සිසුන් මේ අතර සිටියහොත් ඔවුන් සියලු දෙනා කලාප මට්ටමට ඉදිරිපත් කළ හැකිය. තෝරාගත් සිසුන්ගේ පිළිතුරු පත්‍රය ද ලකුණු සමග කලාපයට ඉදිරිපත් කළ යුතුය. ඒ ඒ කොට්ඨාසය අයත් කලාපයේ ගෘහ ආර්ථික විද්‍යා විෂය භාර ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට හා විෂය අධ්‍යක්ෂ මහත්ම මහත්මීන්ට මෙහි ප්‍රශ්න පත්‍ර සකස් කිරීම හා ස්ථානීය පරීක්ෂණය සිදු කිරීමේ වගකීම පැවරේ. කොට්ඨාස මට්ටමේ සහතික එම කොට්ඨාසය අයත් කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ලබා දිය යුතුය.

**2 කාණ්ඩය - පර්යේෂණ ව්‍යාපෘති**

පාසල් මට්ටමින් යොමු කරන සිසුන් සියලු දෙනාගේම පර්යේෂණ ව්‍යාපෘති කොට්ඨාස මට්ටමින් ඇගයීම කළ යුතු ය. ඒ සඳහා ඇමුණුම 02 හි සඳහන් නිර්ණායක 5 හා ප්‍රමිති මිනුම් වගුව අනුව ඇගයීම සිදු කළ යුතු ය. මුළු ලකුණු 20 ක් වේ. වැඩිම ලකුණු ලබා ගත් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් සිසුන් තිදෙනාගේ පර්යේෂණ ව්‍යාපෘතිය ලකුණු සමග කලාප තරග සඳහා ඉදිරිපත් කළ යුතුය. ඒ ඒ කොට්ඨාසය අයත් කලාපයේ ගෘහ ආර්ථික විද්‍යා විෂය භාර ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට හා විෂය අධ්‍යක්ෂ මහත්ම මහත්මීන්ට මෙම පර්යේෂණ ව්‍යාපෘති ඇගයීම සිදු කිරීමේ වගකීම පැවරේ. කොට්ඨාස මට්ටමේ සහතික එම කොට්ඨාසය අයත් කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ලබා දිය යුතුය. පර්යේෂණ ව්‍යාපෘතිය පාසලේ විෂයය භාර ගුරුවරයාගේ නිර්දේශය සහිතව විදුහල්පති සහතික කිරීමෙන් එම ව්‍යාපෘතිය අදාළ සිසුවාගේම බවට සනාථ කර ඉදිරිපත් කළ යුතුය.

**3 කාණ්ඩය - නවෝත්පාදන**

පාසල් මට්ටමින් යොමු කරන සිසුන් සියලු දෙනාගේම නව නිර්මාණ කොට්ඨාස මට්ටමින් ඇගයීම කළ යුතු ය. ඒ සඳහා ඇමුණුම 03 හි සඳහන් නිර්ණායක 5 හා ප්‍රමිති මිනුම් වගුව අනුව ඇගයීම සිදු කළ යුතු ය. මුළු ලකුණු 20 ක් වේ. ඒ ඒ කොට්ඨාසය අයත් කලාපයේ ගෘහ ආර්ථික විද්‍යා විෂය භාර ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට හා විෂය අධ්‍යක්ෂ මහත්ම මහත්මීන්ට මෙම නව නිර්මාණ ඇගයීම සිදු කිරීමේ වගකීම පැවරේ. කොට්ඨාස මට්ටමේ සහතික එම කොට්ඨාසය අයත් කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ලබා දිය යුතුය. පාසල් මට්ටමින් යොමු කරන සිසුන් සියලු දෙනාගේම නව නිර්මාණ වල නිර්මාණය සංවර්ධනය සිදු කරන අවස්ථා ඡායා රූප මගින් තහවුරු කර කලාප මට්ටමට ඉදිරිපත් කළ යුතුය. ශිෂ්‍ය නවෝත්පාදනය පාසලේ විෂයය භාර ගුරුවරයාගේ නිර්දේශය සහිතව විදුහල්පති සහතික කිරීමෙන් එම ව්‍යාපෘතිය සිසුවාගේ බවට සනාථ කර ඉදිරිපත් කළ යුතුය.

මෙම කාණ්ඩය උපකාණ්ඩ දෙකකට බෙදේ.

i. කේවල උපකාණ්ඩය
ii. කණ්ඩායම් උපකාණ්ඩය (උපරිම සිසුන් 03කට යටත්ව)

කෙසේ වුවද මෙම තරග කාණ්ඩය යටතේ කොට්ඨාස මට්ටමින් කලාප මට්ටමට කේවල උපකාණ්ඩ සහ කණ්ඩායම් උපකාණ්ඩ දෙක යටතේම ඉදිරිපත් කළ යුතු උපරිම මුළු තරග අයිතම සංඛ්‍යාව 20 ක් විය යුතුය.

**3.3 කලාප මට්ටමින් සිසුන් තෝරා ගැනීම.**

**1 කාණ්ඩය -ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය**

කොට්ඨාස මට්ටමින් ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු අතර වැඩිම ලකුණු ලබා ගත් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් සිසුන් තිදෙනා කලාප මට්ටමට ඉදිරිපත් කළ යුතුය. කලාප මට්ටමින් තේරී පත් වන ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් සිසුන් තිදෙනා පළාත් මට්ටමට ඉදිරිපත් කළ හැකිය. යම් අවස්ථාවක සම ලකුණු ලබා ගත් සිසුන් මේ අතර සිටියහොත් ඔවුන් සියලු දෙනා පළාත් මට්ටමට ඉදිරිපත් කළ හැකිය. තෝරාගත් සිසුන්ගේ පිළිතුරු පත්‍රය ද ලකුණු සමග පළාතට ඉදිරිපත් කළ යුතුය. තරග සංවිධානය හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ වගකීම අදාළ කලාපය අයත්වන පළාතේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ගෘහ ආර්ථික විද්‍යාව) ගේ පූර්ණ අධීක්ෂණය හා නියාමනය යටතේ කලාපයේ ගෘහ ආර්ථික විද්‍යා විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත හෝ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන) වෙත පැවරේ. කලාප මට්ටමේ සහතික කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ලබා දිය යුතුය.

**2 කාණ්ඩය - පර්යේෂණ ව්‍යාපෘති**

කොට්ඨාස මට්ටමින් යොමු කරන සිසුන් සියලු දෙනාගේම පර්යේෂණ ව්‍යාපෘති කලාප මට්ටමින් ඇගයීම කළ යුතු ය. ඒ සඳහා ඇමුණුම 02 හි සඳහන් නිර්ණායක 5 හා ප්‍රමිති මිනුම් වගුව අනුව ඇගයීම සිදු කළ යුතු ය. මුළු ලකුණු 20 ක් වේ. වැඩිම ලකුණු ලබා ගත් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් සිසුන් තිදෙනාගේ පර්යේෂණ ව්‍යාපෘතිය ලකුණු සමග පළාත් තරග සඳහා ඉදිරිපත් කළ යුතුය. තරග සංවිධානය හා මෙම පර්යේෂණ ව්‍යාපෘති ඇගයීමේ වගකීම අදාළ කලාපය අයත්වන පළාතේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ගෘහ ආර්ථික විද්‍යාව) ගේ පූර්ණ අධීක්ෂණය හා නියාමනය යටතේ කලාපයේ ගෘහ ආර්ථික විද්‍යා විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත හෝ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන) වෙත පැවරේ. කලාප මට්ටමේ සහතික කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ලබා දිය යුතුය. පර්යේෂණ ව්‍යාපෘතිය පාසලේ විෂයය භාර ගුරුවරයාගේ නිර්දේශය සහිතව විදුහල්පති සහතික කිරීමෙන් එම ව්‍යාපෘතිය සිසුවාගේ බවට සනාථ කර ඉදිරිපත් කළ යුතුය.

**3 කාණ්ඩය - නවෝත්පාදනය**

කොට්ඨාස මට්ටමින් යොමු කරන සිසුන් සියලු දෙනාගේම නවෝත්පාදනය කලාප මට්ටමින් ඇගයීම කළ යුතු ය. ඒ සඳහා ඇමුණුම 03 හි සඳහන් නිර්ණායක 5 හා ප්‍රමිති මිනුම් වගුව අනුව ඇගයීම සිදු කළ යුතු ය. මුළු ලකුණු 20 ක් වේ. තරග සංවිධානය හා මෙම නව නිර්මාණ ඇගයීමේ වගකීම අදාළ කලාපය අයත්වන පළාතේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ගෘහ ආර්ථික විද්‍යාව) ගේ පූර්ණ අධීක්ෂණය හා නියාමනය යටතේ කලාපයේ ගෘහ ආර්ථික විද්‍යා විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත හෝ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන) වෙත පැවරේ. කලාප මට්ටමේ සහතික කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ලබා දිය යුතුය. ශිෂ්‍ය නවෝත්පාදනය පාසලේ විෂයය භාර ගුරුවරයාගේ නිර්දේශය සහිතව විදුහල්පති සහතික කිරීමෙන් එම ව්‍යාපෘතිය සිසුවාගේ බවට සනාථ කර ඉදිරිපත් කළ යුතුය.

මෙම කාණ්ඩය උපකාණ්ඩ දෙකකට බෙදේ.

i. කේවල උපකාණ්ඩය
ii. කණ්ඩායම් උපකාණ්ඩය (උපරිම සිසුන් 03කට යටත්ව)

මෙම තරග කාණ්ඩය යටතේ කලාප මට්ටමින් පළාත් මට්ටමට කේවල උපකාණ්ඩ සහ කණ්ඩායම් උප කාණ්ඩය යන උප කාණ්ඩ දෙක යටතේම ඉදිරිපත් කළ යුතු උපරිම මුළු තරග අයිතම සංඛ්‍යාව 20 ක් විය යුතුය.

**3.4 පළාත් මට්ටමින් සිසුන් තෝරා ගැනීම**

**1 කාණ්ඩය - ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය**

කලාප මට්ටමින් ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු අතර වැඩිම ලකුණු ලබාගෙන ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් සිසුන් තිදෙනා පළාත් මට්ටමට ඉදිරිපත් කළ යුතුය. පළාත් මට්ටමින් තේරී පත්වන වැඩිම ලකුණු ලබා ගත් සිසුන් දස දෙනා ජාතික මට්ටමට ඉදිරිපත් කළ හැකිය. තෝරාගත් සිසුන්ගේ පිළිතුරු පත්‍රය ද ලකුණු සමග ජාතික මට්ටමට ඉදිරිපත් කළ යුතුය. තරග සංවිධානය හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ වගකීම අදාළ පළාත අයත්වන පළාත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ගෘහ ආර්ථික විද්‍යාව) වෙත පැවරේ. පළාත් මට්ටමේ සහතික පළාත් අධ්‍යාපන කාර්යාලයෙන් ලබා දිය යුතුය.

**2 කාණ්ඩය - පර්යේෂණ ව්‍යාපෘති**

කලාප මට්ටමින් යොමු කරන සිසුන් සියලු දෙනාගේම පර්යේෂණ ව්‍යාපෘති පළාත් මට්ටමින් ඇගයීම කළ යුතු ය. ඒ සඳහා ඇමුණුම 02 හි සඳහන් නිර්ණායක 5 හා ප්‍රමිති මිනුම් වගුව අනුව ඇගයීම සිදු කළ යුතු ය. මුළු ලකුණු 20 ක් වේ. පළාත් මට්ටමින් තේරී පත්වන වැඩිම ලකුණු ලබා ගත් සිසුන් දස දෙනා ජාතික මට්ටමට ඉදිරිපත් කළ හැකිය. තරග සංවිධානය ඇගයීම් කිරීමේ වගකීම අදාළ පළාත අයත්වන පළාත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ගෘහ ආර්ථික විද්‍යාව) වෙත පැවරේ. පළාත් මට්ටමේ සහතික පළාත් අධ්‍යාපන කාර්යාලයෙන් ලබා දිය යුතුය. පර්යේෂණ ව්‍යාපෘතිය පාසලේ විෂයය භාර ගුරුවරයාගේ නිර්දේශය සහිතව විදුහල්පති සහතික කිරීමෙන් එම ව්‍යාපෘතිය සිසුවාගේ බවට සනාථ කර ඉදිරිපත් කළ යුතුය.

**3 කාණ්ඩය -නවෝත්පාදනය**

කලාප මට්ටමින් යොමු කරන සිසුන් සියලු දෙනාගේම නවෝත්පාදනය පළාත් මට්ටමින් ඇගයීම කළ යුතු ය. ඒ සඳහා ඇමුණුම 03 හි සඳහන් නිර්ණායක 5 හා ප්‍රමිති මිනුම් වගුව අනුව ඇගයීම සිදු කළ යුතු ය. මුළු ලකුණු 20 ක් වේ. පළාත් මට්ටමින් තේරී පත් වන වැඩිම ලකුණු ලබා ගත් සිසුන් දස දෙනා ජාතික මට්ටමට ඉදිරිපත් කළ හැකිය. තරග සංවිධානය ඇගයීම් කිරීමේ වගකීම අදාළ පළාත අයත්වන පළාත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ගෘහ ආර්ථික විද්‍යාව) වෙත පැවරේ. පළාත් මට්ටමේ සහතික පළාත් අධ්‍යාපන කාර්යාලයෙන් ලබා දිය යුතුය. ශිෂ්‍ය නවෝත්පාදනය පාසලේ විෂයය භාර ගුරුවරයාගේ නිර්දේශය සහිතව විදුහල්පති සහතික කිරීමෙන් එම ව්‍යාපෘතිය සිසුවාගේ බවට සනාථ කර ඉදිරිපත් කළ යුතුය.
මෙම කාණ්ඩය උපකාණ්ඩ දෙකකට බෙදේ.

i. කේවල උපකාණ්ඩය
ii. කණ්ඩායම් උපකාණ්ඩය (උපරිම සිසුන් 03කට යටත්ව)

තෝරාගත් සිසුන්ගේ තරග අයිතම (කේවල උපකාණ්ඩය සහ කණ්ඩායම් උපකාණ්ඩය යටතේ) ලකුණු සමග ජාතික මට්ටමට ඉදිරිපත් කළ යුතුය. මෙම තරග කාණ්ඩය යටතේ පළාත් මට්ටමින් ජාතික මට්ටමට කේවල උපකාණ්ඩය හා කණ්ඩායම් උපකාණ්ඩය යන උපකාණ්ඩ දෙක යටතේම ඉදිරිපත් කළ යුතු උපරිම මුළු තරග අයිතම සංඛ්‍යාව 10 ක් විය යුතුය.

**3.5 ජාතික මට්ටමින් සිසුන් තෝරා ගැනීම.**

**1 කාණ්ඩය - ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය**

පළාත් මට්ටමින් ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය සඳහා පෙනී සිට පළාත් මට්ටමින් තේරී පත් වන වැඩිම ලකුණු ලබා ගත් සිසුන් දස දෙනා ජාතික මට්ටමට ඉදිරිපත් කළ හැකිය. පළාත් මට්ටමේ දී 10 වන ස්ථානය සඳහා සම ලකුණු ලබන අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් සිටින අවස්ථාවලදී එම සම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන්ට ගෘහ ආර්ථික විද්‍යාව විෂයට අදාළ අතිරේක වාචික ප්‍රශ්න ගණනක් යොමු කර ඉන් වැඩිම ලකුණු ලබා ගන්නා සිසුවා 10 වන ස්ථානය සඳහා තෝරා ගැනීමට ඉහත සඳහන් මට්ටම්වල විනිශ්චය මණ්ඩලය ප්‍රමුඛ අදාළ සම්බන්ධීකාරක නිලධාරීන් විසින් වගකීම දැරිය යුතුය. තෝරාගත් සිසුන්ගේ ලකුණු සමග ජාතික මට්ටමට ඉදිරිපත් කළ යුතුය. තරග සංවිධානය හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ වගකීම අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණ අධ්‍යාපන ශාඛාව විසින් සිදු කරන අතර ජාතික මට්ටමේ සහතික අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණ අධ්‍යාපන ශාඛාව විසින් ලබා දෙනු ලැබේ.

**2 කාණ්ඩය - පර්යේෂණ ව්‍යාපෘති**

පළාත් මට්ටමින් පර්යේෂණ ව්‍යාපෘති ඉදිරිපත් කර පළාත් මට්ටමින් තේරී පත් වන වැඩිම ලකුණු ලබා ගත් සිසුන් දස දෙනා ජාතික මට්ටමට ඉදිරිපත් කළ හැකිය. තෝරාගත් සිසුන්ගේ ලකුණු සමග ජාතික මට්ටමට ඉදිරිපත් කළ යුතුය. තරග සංවිධානය හා ඇගයීම අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණ අධ්‍යාපන ශාඛාව විසින් සිදු කරන අතර ජාතික මට්ටමේ සහතික අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණ අධ්‍යාපන ශාඛාව විසින් ලබා දෙනු ලැබේ.

**3 කාණ්ඩය - නවෝත්පාදනය**

පළාත් මට්ටමින් තෝරා පත්කර එවනු ලබන වැඩිම ලකුණු ලබා ගත් තරග අයිතම දහය (කේවල උපකාණ්ඩ සහ කණ්ඩායම් උපකාණ්ඩ දෙකම යටතේ) ජාතික මට්ටමේදී ඇගයීමට ලක් කළ යුතුය. තරග සංවිධානය හා ඇගයීම අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණ අධ්‍යාපන ශාඛාව විසින් සිදු කරන අතර ජාතික මට්ටමේ සහතික අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණ අධ්‍යාපන ශාඛාව විසින් ලබා දෙනු ලැබේ.

4. **තරග මට්ටම් සඳහා කාල වකවානු**

1) පාසල් මට්ටමේ තරග - අප්‍රේල් 15 ට පෙර පැවැත්විය යුතුය.
2) කොට්ඨාස මට්ටමේ තරග - මැයි 01 ට පෙර පැවැත්විය යුතුය.
3) කලාප මට්ටමේ තරග - ජුනි 15 ට පෙර පැවැත්විය යුතුය.
4) පළාත් මට්ටමේ තරග - අගෝස්තු 15 ට පෙර පැවැත්විය යුතුය.
5) ජාතික මට්ටමේ තරග - ඔක්තෝම්බර් 15ට පෙර පැවැත්විය යුතුයි.

සැ.යු.- ඒ ඒ අධ්‍යයන වර්ෂයේ දී පාසල් වාර සටහන නිකුත් වූ පසුව අවශ්‍යතාව පරිදි ඉහත තරග මට්ටම්වල කාලවකවානු සංශෝධනය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (තාක්ෂණ අධ්‍යාපන) හට හැකිය.

**5. තරග කාණ්ඩ සඳහා උපදෙස්**

**1 කාණ්ඩය - ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය**

- මෙම කාණ්ඩයට පෙනී සිටින සිසුන් ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය යන දෙකටම පෙනී සිටිය යුතුය. මෙය එක් තරග කාණ්ඩයක් ලෙස සැළකේ.
- මෙයට මුළු ලකුණු 100 කි.
  ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 40 ක් සහ ස්ථානීය පරීක්ෂණය සඳහා ලකුණු 60 ක් ලෙස වෙන් වේ.

**1 කාණ්ඩය - ලිඛිත ප්‍රශ්න පත්‍රය**

❖ **ව්‍යුහය**

- ප්‍රශ්න 40 කි.
- එයට පිළිතුරු 4 ක් සහිත බහුවරණ 20 ක්, හිස්තැන් පිරවීම් 15 ක් සහ ඇඳීමේ වර්ගයේ ප්‍රශ්න 05 ක් ඇතුළත් විය යුතු ය.
- මෙම ප්‍රශ්න පත්‍රය 10 හා 11 ශ්‍රේණිවල ගෘහ ආර්ථික විද්‍යා විෂයය නිර්දේශයට අදාළ වන ප්‍රශ්න පත්‍රයක් විය යුතුය.
- කාලය පැය 01 කි.

❖ **ලකුණු**

- ලකුණු 40 කි. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලබා දිය යුතුය.

**1 කාණ්ඩය - ස්ථානීය පරීක්ෂණය (Spot Test)**

❖ **ව්‍යුහය**

ගෘහ ආර්ථික විද්‍යාව විෂයයට අදාළ නිදර්ශක (ජීවී හා අජීවී ලෙස) වෙන වෙනම පන්ති කාමරයක් තුළ ස්ථානගත කර ඊට අදාළ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමට යොමු කළ යුතුය. නියමිත කාලය තුළ නිදර්ශක ඇසුරින් නිශ්චිත පිළිතුරු සැපයිය හැකි ලෙස ප්‍රශ්න සකස් කිරීමට අවධානය යොමු කළ යුතුය. ස්ථානීය පරීක්ෂණය සඳහා නිදර්ශක 30ක් සැලසුම් කළ යුතුය. එක් ස්ථානයක් සඳහා වෙන් කරන කාලය මිනිත්තු 02 බැගින් මුළු කාලය මිනිත්තු 60 කි. (මේ සඳහා මූලාකෘති ප්‍රශ්න කිහිපයක් අමුණා ඇත.)

❖ **ලකුණු**

- එක් නිදර්ශයකට ලකුණු 2 බැගින් 2×30 = 60 කි. (ප්‍රශ්න 30ක් සහිතව)

**2 කාණ්ඩය - පර්යේෂණ ව්‍යාපෘති**

ගෘහ ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍ර 4ක් ඔස්සේ පර්යේෂණ ව්‍යාපෘතිය සිදු කළ හැකිය.

1. ආහාර හා පෝෂණ ක්ෂේත්‍රය
2. ගෘහ කළමනාකරණ ක්ෂේත්‍රය
3. රෙදිපිළි තාක්ෂණ ක්ෂේත්‍රය
4. ළමා සංවර්ධන ක්ෂේත්‍රය

මෙම තරගය සඳහා ඉදිරිපත් වන සිසුන් පහත දැක්වෙන පරිදි පර්යේෂණ ව්‍යාපෘතිය සිදුකළ යුතුය.

1. උක්ත ක්ෂේත්‍රවලින් එකක් තෝරාගෙන පිටු පහකට නොවැඩි පර්යේෂණ යෝජනාවක් සකස් කර විෂය භාර ගුරුවරයාගේ නිර්දේශය සහ පාසලේ විදුහල්පතිවරයාගේ අනුමැතියෙන් කෙටි පර්යේෂණයක් සිදු කළ හැකිය.
2. පර්යේෂණ යෝජනාවක් ඉදිරිපත් කිරීමේ ආකෘතිය
    1. පර්යේෂණ ගැටළුව හඳුනා ගැනීම
    2. පර්යේෂණ මාතෘකාවක් තෝරා ගැනීම
    3. පර්යේෂණ ක්‍රමවේදය ඉදිරිපත් කිරීම
3. සති 02ක වැනි කාලයකදී කෙටි පර්යේෂණය නිම කර ව්‍යාපෘති වාර්තාවක් හා සමර්පණ (power point) මගින් ඉදිරිපත් කිරීම කළ යුතුය.

**3 කාණ්ඩය - නවෝත්පාදනය**

ගෘහ ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍ර 4 ක් ඔස්සේ නවෝත්පාදනය සිදු කළ හැකිය.

1. ආහාර හා පෝෂණ ක්ෂේත්‍රය
2. ගෘහ කළමනාකරණ ක්ෂේත්‍රය
3. රෙදිපිළි තාක්ෂණ ක්ෂේත්‍රය
4. ළමා සංවර්ධන ක්ෂේත්‍රය

a. උක්ත ක්ෂේත්‍රවලින් එකක් තෝරාගෙන නවෝත්පාදනයේ මූලික සැලැස්මක් සකස් කර විෂය භාර ගුරුවරයාගේ නිර්දේශය මත පාසලේ විදුහල්පතිවරයාගේ අනුමැතියෙන් නවෝත්පාදනය සකස් කර මූලික සැලැස්ම සමග ඉදිරිපත් කළ යුතුය.

b. නවෝත්පාදනය ඊළඟ මට්ටම සඳහා ඉදිරිපත් කිරීමේ දී ඒ ඒ මට්ටම්වලදී ලැබෙන සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත කර වැඩිදියුණු කරන ලද අදාළ නවෝත්පාදනය ඉදිරි මට්ටම සඳහා ඉදිරිපත් කළ හැකිය.

c. එහිදී ආරම්භයේ සිටම සෑම මට්ටමකදීම ඡායාරූප මගින් සිසුවාගේ නවෝත්පාදනය ස්ව අයිතිය සනාථ කළ යුතුය.

**6. භාෂා මාධ්‍යය**

සිංහල හා දෙමළ මාධ්‍ය දෙක සඳහා වෙන් වෙන් වශයෙන් තරග නොපැවැත්විය යුතුයි. අදාළ භාෂා මධ්‍යයට පරිවර්තනය කර සිංහල හා දෙමළ මාධ්‍ය තරග එකම දිනයේ එකම වේලාවක දී පැවැත්විය යුතුයි. අවසානයේ භාෂා මාධ්‍ය නොසලකා හැර ලබා ගත් ලකුණු පදනම මත පමණක් සිසුන් තෝරා ගත යුතුය.

**7. ජාතික මට්ටමේ දී සහතික පත්‍ර ලබා දීම**

ජාතික මට්ටම සඳහා සහභාගී වන සියලු තරගකරුවන් සඳහා සහභාගීත්ව සහතික ද එක් එක් තරග කාණ්ඩයකින් මුල් ස්ථාන 10 ලබා ගන්නා තරග අයිතම 30 හිමි තරගකරුවන් සඳහා ජය සංකේත ද ප්‍රදානය කිරීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරනු ලැබේ.

## 8. පොදු උපදෙස්

පාසල්, කොට්ඨාස, කලාප, පළාත් සහ ජාතික යන සෑම මට්ටමකදීම 3 කාණ්ඩය - නවෝත්පාදන තරග කාණ්ඩය යටතේදී කේවල (තනි පුද්ගල) මෙන්ම කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් විය හැකි නමුත් කණ්ඩායමක උපරිම සාමාජික සංඛ්‍යාව තුනකට (03) පමණක් සීමා විය යුතුය. කේවල උපකාණ්ඩය සහ කණ්ඩායම් උපකාණ්ඩය යන ආකාර දෙකෙහිදීම ඇමුණුම 03 පරිදි ලකුණු ලබා දීම සිදු කළ යුතුය.

මගේ සමාංක ED/1/17/2/HES/W05 සහ 2015.02.19 දිනැති අංක 09/2015 දරන චක්‍රලේඛය මින් අවලංගු වන බවත් භාෂා පරිවර්තන අතර අනනුකූලතාවයක දී සිංහල පිටපත බලාත්මක බවත් වැඩිදුරටත් දන්වමි.

ඇමුණුම 01. ස්ථානීය පරීක්ෂණය සඳහා ආදර්ශ ප්‍රශ්න
ඇමුණුම 02. පර්යේෂණ ව්‍යාපෘතිය තේරීමේ නිර්ණායක
ඇමුණුම 03. නව නිර්මාණ තේරීමේ නිර්ණායක

නාලක කලුවැව
ලේකම්

පිටපත් :-

1. සියලු ම පළාත් ගෘහ ආර්ථික විද්‍යාව විෂය සම්බන්ධීකාරක නිලධාරීන් - කරු.අ.කා.ස
2. සියලු ම කලාප ගෘහ ආර්ථික විද්‍යාව විෂය සම්බන්ධීකාරක නිලධාරීන් - කරු.අ.කා.ස

## ස්ථානීය පරීක්ෂණය සඳහා ආදර්ශ ප්‍රශ්න

❖ ආහාර හා පෝෂණය

(i) දී ඇති A, B, C සහ D නිදර්ශක නම් කරන්න.

A. ......................................  C. ....................................

B. .....................................  D. ....................................

(ii) ළදරුවකුට අතිරේක ආහාරයක් ලෙස මෙම නිරර්ශක ලබා දෙනු ලබන්නේ කුමන ආකාරයකටද?

- ......................................................

❖ ගෘහ කළමනාකරණය

(i) දෙන ලද රූප සටහන නිරීක්ෂණය කර (ගෙවත්තක රූපයක්) තම අයිතිය සඳහා මායිම් සැකසීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

- ..............................................................
- ..............................................................

(ii) මෙම ස්ථානය වඩාත් අලංකාර කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(i) ........................................  (ii) ..................................................

❖ රෙදි පිළි තාක්ෂණය

(i) දෙන ලද නිදර්ශකයේ දැක්වෙන මැහුම් ක්‍රමය නම් කරන්න.

.................................................

(ii) මෙම මැහුම් ක්‍රමය භාවිත කිරීමට සුදුසු අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

.................................................

❖ ළමා සංවර්ධනය

(i) මෙම රූප සටහනේ A, B, C, සහ D යන ස්ථාන නම් කර, එම ස්ථානයෙන් සිදුවන කාර්යයක් බැගින් සඳහන් කරන්න.

| නම | කාර්යය |
|---|---|
| A. ........................... | ............................................. |
| B. ............................. | ............................................. |
| C. ............................. | ............................................. |
| D. ............................. | ............................................ |

ඇමුණුම 02

<u>පර්යේෂණ ව්‍යාපෘතිය තේරීමේ නිර්ණායක</u>

**ගෘහ ආර්ථික විද්‍යා විෂයය සඳහා පර්යේෂණ ව්‍යාපෘතියක් තෝරා ගැනීම සඳහා පහත නිර්ණායක 5 භාවිතා කළ හැක.**

1. ගෘහ ආර්ථික විද්‍යා විෂයයට අදාළ වීම
    - තෝරාගන්නා පර්යේෂණ මාතෘකාව ආහාර හා පෝෂණය, ගෘහ කළමනාකරණය, රෙදිපිළි තාක්ෂණය හා ළමා සංවර්ධනය යන ගෘහ ආර්ථික විද්‍යාවේ ප්‍රධාන අංශයන්ට අදාළ ව සිදු කරන ලද පර්යේෂණයක් විය යුතුය. එකී ක්ෂේත්‍රවල සැබෑ ගැටළුවක් තෝරාගෙන තිබිය යුතුය. එම ගැටළුවට සුදුසු විසඳුම් පර්යේෂණයෙන් ඉදිරිපත් කළ යුතුය.

2. ප්‍රායෝගිකභාවය හා සැබෑ ජීවිතයට ඇති වැදගත්කම
    - තෝරාගත් පර්යේෂණය ප්‍රායෝගික, බහුතරයකට ප්‍රයෝජනවත් හා දෛනික ජීවිතයට ගැළපෙන විය යුතුය.

3. දේශීය සම්පත් භාවිතය හා දත්ත පහසුවෙන් ලබාගත හැකි වීම.
    - සිසුන්ට පර්යේෂණය කිරීමට අවශ්‍ය සම්පත් දේශීයව පහසුවෙන් සොයා ගත හැකි පරිසරයට හානි නොවන දේ විය යුතුය. එසේම දත්ත පහසුවෙන් අඩු වියදමකින් ලබා ගත හැකි පර්යේෂණයක් විය යුතුය.

      (අතිශයින් බරපතල, මූල්‍යමය වශයෙන් වියදම් අධික හෝ සිදු කළ නොහැකි මාතෘකාවලින් වැලකිය යුතුය.)

4. පර්යේෂණ අනාවරණ හා විසඳුම් යෝජනා තිබීම.
    - පර්යේෂණ අනාවරණ පර්යේෂණ වාර්තාවේ සඳහන් විය යුතුය. එම අනාවරණ මගින් අනාවරණය වන කරුණු සඳහා පර්යේෂක යෝජනා සිසුවා විසින් ඉදිරිපත් කළ යුතු අතර එම යෝජනා ප්‍රායෝගික විය යුතුය.

5. කාල කළමනාකරණය
    - පර්යේෂණ ව්‍යාපෘතිය සිසුන්ට ලබාදී ඇති සති 02 ක කාල සීමාව තුළ අවසන් කළ යුතුය. පර්යේෂණ ව්‍යාපෘති යෝජනාව පාසලේ විදුහල්පති වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගෙන සිදු කළ යුතුය. පර්යේෂණය සඳහා ව්‍යාපෘති වාර්තාව එම සති 02 ක කාලය තුළ සම්පූර්ණ කර පිටපත් 03 කින් ඉදිරිපත් කළ යුතුය.

## ගෘහ ආර්ථික විද්‍යා විෂය සඳහා පර්යේෂණ ව්‍යාපෘතියක් තෝරා ගැනීම සඳහා ප්‍රමිති මිනුම් වගුව

| නිර්ණායක | ඉතා හොඳයි (4) | හොඳයි (3) | සාමාන්‍යයි (2) | සංවර්ධනය විය යුතුය (1) |
|---|---|---|---|---|
| ගෘහ ආර්ථික විද්‍යා විෂයයට අදාළ වීම. | තෝරා ගත් පර්යේෂණ මාතෘකාව ආහාර හා පෝෂණය, ගෘහ කළමනාකරණය, රෙදිපිළි තාක්ෂණය හා ළමා සංවර්ධනය යන ගෘහ ආර්ථික විද්‍යාවේ ප්‍රධාන අංශයන්ට අදාළ ව සිදුකර ඇත.<br>එකී ක්ෂේත්‍ර වල සැබෑ ගැටළුවක් තෝරා ගෙන ඇත.<br>එම ගැටළුවට සුදුසු විසඳුම් පර්යේෂණයෙන් ඉදිරිපත් කර ඇත. | තෝරා ගත් පර්යේෂණ මාතෘකාව ආහාර හා පෝෂණය, ගෘහ කළමනාකරණය, රෙදිපිළි තාක්ෂණය හා ළමා සංවර්ධනය යන ගෘහ ආර්ථික විද්‍යාවේ ප්‍රධාන අංශයන්ට අදාළ ව සිදුකර ඇත.<br>එකී ක්ෂේත්‍ර වල සැබෑ ගැටළුවක් තෝරා ගෙන ඇත.<br>එම ගැටළුවට සුදුසු විසඳුම් පර්යේෂණයෙන් ඉදිරිපත් කර නැත. | තෝරා ගත් පර්යේෂණ මාතෘකාව ආහාර හා පෝෂණය, ගෘහ කළමනාකරණය, රෙදිපිළි තාක්ෂණය හා ළමා සංවර්ධනය යන ගෘහ ආර්ථික විද්‍යාවේ ප්‍රධාන අංශයන්ට අදාළ ව සිදුකර ඇත.<br>එකී ක්ෂේත්‍ර වල සැබෑ ගැටළුවක් තෝරා ගෙන නැත.<br>එම ගැටළුවට සුදුසු විසඳුම් පර්යේෂණයෙන් ඉදිරිපත් කර නැත. | තෝරා ගත් පර්යේෂණ මාතෘකාව ආහාර හා පෝෂණය, ගෘහ කළමනාකරණය, රෙදිපිළි තාක්ෂණය හා ළමා සංවර්ධනය යන ගෘහ ආර්ථික විද්‍යාවේ ප්‍රධාන අංශයන්ට අදාල ව සිදුකර නැත.<br>එකී ක්ෂේත්‍ර වල සැබෑ ගැටළුවක් තෝරා ගෙන නැත.<br>එම ගැටළුවට සුදුසු විසඳුම් පර්යේෂණයෙන් ඉදිරිපත් කර නැත. |
| ප්‍රායෝගිකභාවය හා සැබෑ ජීවිතයට ඇති වැදගත්කම | තෝරාගත් පර්යේෂණය ප්‍රායෝගික වේ.<br>බහුතරයකට ප්‍රයෝජනවත් විය හැක.<br>දෛනික ජීවිතයට ගැළපේ. | තෝරාගත් පර්යේෂණය ප්‍රායෝගික වේ.<br>බහුතරයකට ප්‍රයෝජනවත් විය හැක.<br>දෛනික ජීවිතයට නොගැළපේ. | තෝරාගත් පර්යේෂණය ප්‍රායෝගික වේ.<br>බහුතරයකට ප්‍රයෝජනවත් නොවේ.<br>දෛනික ජීවිතයට නොගැළපේ. | තෝරාගත් පර්යේෂණය ප්‍රායෝගික නොවේ.<br>බහුතරයකට ප්‍රයෝජනවත් නොවේ.<br>දෛනික ජීවිතයට නොගැළපේ. |
| දේශීය සම්පත් භාවිතය හා දත්ත පහසුවෙන් ලබාගත හැකි වීම. | සිසුන්ට පර්යේෂණය කිරීමට අවශ්‍ය සම්පත් දේශීයව පහසුවෙන් සොයා ගත හැකිය.<br>පරිසරයට හානි නොවන සම්පත් භාවිත කර ඇත.<br>දත්ත පහසුවෙන් අඩු වියදමකින් ලබා ගත හැකිය. | සිසුන්ට පර්යේෂණය කිරීමට අවශ්‍ය සම්පත් දේශීයව පහසුවෙන් සොයා ගත හැකිය.<br>පරිසරයට හානි නොවන සම්පත් භාවිත කර ඇත.<br>දත්ත පහසුවෙන් අඩු වියදමකින් ලබා ගත නොහැකිය. | සිසුන්ට පර්යේෂණය කිරීමට අවශ්‍ය සම්පත් දේශීයව පහසුවෙන් සොයා ගත හැකිය.<br>පරිසරයට හානි වන සම්පත් භාවිතා කර ඇත.<br>දත්ත පහසුවෙන් අඩු වියදමකින් ලබා ගත නොහැකිය. | සිසුන්ට පර්යේෂණය කිරීමට අවශ්‍ය සම්පත් දේශීයව පහසුවෙන් සොයා ගත නොහැකිය.<br>පරිසරයට හානි වන සම්පත් භාවිත කර ඇත.<br>දත්ත පහසුවෙන් අඩු වියදමකින් ලබා ගත නොහැකිය. |
| පර්යේෂණ අනාවරණ හා විසඳුම් යෝජනා තිබීම. | පර්යේෂණ අනාවරණ පර්යේෂණ වාර්තාවේ සඳහන්ව ඇත.<br>එම අනාවරණ මගින් අනාවරණය වන කරුණු සඳහා පර්යේෂක සිසුවා විසින් යෝජනා ඉදිරිපත් කර ඇත.<br>එම යෝජනා ප්‍රායෝගික වේ. | පර්යේෂණ අනාවරණ පර්යේෂණ වාර්තාවේ සඳහන්ව ඇත.<br>එම අනාවරණ මගින් අනාවරණය වන කරුණු සඳහා පර්යේෂක සිසුවා විසින් යෝජනා ඉදිරිපත් කර ඇත.<br>නමුත් එම යෝජනා ප්‍රායෝගික නොවේ. | පර්යේෂණ අනාවරණ පර්යේෂණ වාර්තාවේ සඳහන්ව ඇත.<br>එම අනාවරණ මගින් අනාවරණය වන කරුණු සඳහා පර්යේෂක සිසුවා විසින් යෝජනා ඉදිරිපත් කර නැත.<br>නමුත් එම යෝජනා ප්‍රායෝගික නොවේ. | පර්යේෂණ අනාවරණ පර්යේෂණ වාර්තාවේ සඳහන්ව නැත.<br>එම අනාවරණ මගින් අනාවරණය වන කරුණු සඳහා පර්යේෂක සිසුවා විසින් යෝජනා ඉදිරිපත් කර නැත.<br>නමුත් එම යෝජනා ප්‍රායෝගික නොවේ. |
| කාල කළමනාකරණය | පර්යේෂණ ව්‍යාපෘතිය සිසුන්ට ලබාදී ඇති සති 02 ක කාල සීමාව තුළ අවසන් කර ඇත.<br><br>පර්යේෂණ ව්‍යාපෘති යෝජනාව පාසලේ විදුහල්පති වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගෙන සිදු කර ඇත.<br><br>පර්යේෂණය සඳහා ව්‍යාපෘති වාර්තාව එම සති 02 ක කාලය තුළ සම්පූර්ණ කර පිටපත් 03 කින් ඉදිරිපත් කර ඇත. | පර්යේෂණ ව්‍යාපෘතිය සිසුන්ට ලබාදී ඇති සති 02 ක කාල සීමාව තුළ අවසන් කර ඇත.<br><br>පර්යේෂණ ව්‍යාපෘති යෝජනාව පාසලේ විදුහල්පති වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගෙන සිදු කර ඇත.<br><br>පර්යේෂණය සඳහා ව්‍යාපෘති වාර්තාව එම සති 02 ක කාලය තුළ සම්පූර්ණ කර පිටපත් 03 කින් ඉදිරිපත් කර නැත. | පර්යේෂණ ව්‍යාපෘතිය සිසුන්ට ලබාදී ඇති සති 02 ක කාල සීමාව තුළ අවසන් කර ඇත.<br><br>පර්යේෂණ ව්‍යාපෘති යෝජනාව පාසලේ විදුහල්පති වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගෙන සිදු කර නැත.<br><br>පර්යේෂණය සඳහා ව්‍යාපෘති වාර්තාව එම සති 02 ක කාලය තුළ සම්පූර්ණ කර පිටපත් 03 කින් ඉදිරිපත් කර නැත. | පර්යේෂණ ව්‍යාපෘතිය සිසුන්ට ලබාදී ඇති සති 02 ක කාල සීමාව තුළ අවසන් කර නැත.<br><br>පර්යේෂණ ව්‍යාපෘති යෝජනාව පාසලේ විදුහල්පති වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගෙන සිදු කර නැත.<br><br>පර්යේෂණය සඳහා ව්‍යාපෘති වාර්තාව එම සති 02 ක කාලය තුළ සම්පූර්ණ කර පිටපත් 03 කින් ඉදිරිපත් කර නැත. |

ඇමුණුම 03

**<u>සාමාන්‍ය පෙළ ගෘහ ආර්ථික විද්‍යා විෂය සඳහා නවෝත්පාදන (Innovation) තෝරා ගැනීමේ නිර්ණායක</u>**

1. ගෘහ ආර්ථික විද්‍යා විෂයයට අදාළ වීම.

    - නවෝත්පාදනය ආහාර හා පෝෂණය, ගෘහ කළමනාකරණය, රෙදිපිළි තාක්ෂණය හා ළමා සංවර්ධනය යන ගෘහ ආර්ථික විද්‍යාවේ ප්‍රධාන අංශයන්ට අදාළ ව සිදු කරන ලද නිර්මාණයක් විය යුතුය. එකී ක්ෂේත්‍රවල සැබෑ ගැටළුවක් තෝරා ගෙන තිබිය යුතුය. එම ගැටළුවට සුදුසු විසඳුම් නවෝත්පාදනයෙන් ඉදිරිපත් කළ යුතුය.

2. ප්‍රායෝගිකභාවය හා සැබෑ ජීවිතයට ඇති වැදගත්කම

    - නවෝත්පාදනය ප්‍රායෝගික, බහුතරයකට ප්‍රයෝජනවත් හා දෛනික ජීවිතයට ගැළපෙන විය යුතුය.

3. දේශීය සම්පත් භාවිත කිරීමට හැකි වීම.

    - නවෝත්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් දේශීයව පහසුවෙන් සොයා ගත හැකි පරිසරයට හානි නොවන දේ විය යුතුය. එසේම එම සම්පත් අඩු වියදමකින් ලබා ගත හැකි නවෝත්පාදනයක් විය යුතුය.

4. ගැටළුව සඳහා විසඳුම් යෝජනා තිබීම.
    - නවෝත්පාදනය මගින් හඳුනාගත් ගැටළුව සඳහා විසඳුම් යෝජනා ඉදිරිපත් විය යුතු අතර එම යෝජනා ප්‍රායෝගික විය යුතුය.

5. නිර්මාණශීලී ලෙස නවීන තාක්ෂණය භාවිත කර තිබීම.

    - නවෝත්පාදනය නවතම තාක්ෂණය හෝ නිර්මාණශීලී සංකල්පයන් මත පදනම් විය යුතුය. එය ආරක්ෂිත, ලෙස සැලසුම් කර තිබිය යුතුය.

**ගෘහ ආර්ථික විද්‍යා විෂය සඳහා නවෝත්පාදන (Innovation) තෝරා ගැනීම සඳහා ප්‍රමිති මිනුම් වගුව**

| නිර්ණායකය | ඉතා හොඳයි (4) | හොඳයි (3) | සාමාන්‍යයි (2) | සංවර්ධනය විය යුතුය(1) |
|---|---|---|---|---|
| ගෘහ ආර්ථික විද්‍යා විෂයයට අදාළ වීම. | නවෝත්පාදනය ආහාර හා පෝෂණය, ගෘහ කළමනාකරණය, රෙදිපිළි තාක්ෂණය හා ළමා සංවර්ධනය යන ගෘහ ආර්ථික විද්‍යාවේ ප්‍රධාන අංශයන්ට අදාල ව සිදු කරන ලද නිර්මාණයකි.<br><br>එකී ක්ෂේත්‍ර වල සැබෑ ගැටළුවක් තෝරා ගෙන ඇත.<br><br>එම ගැටළුවට සුදුසු විසඳුම් නවෝත්පාදනයෙන් ඉදිරිපත් කර ඇත. | නවෝත්පාදනය ආහාර හා පෝෂණය, ගෘහ කළමනාකරණය, රෙදිපිළි තාක්ෂණය හා ළමා සංවර්ධනය යන ගෘහ ආර්ථික විද්‍යාවේ ප්‍රධාන අංශයන්ට අදාළ ව සිදු කරන ලද නිර්මාණයකි.<br><br>එකී ක්ෂේත්‍රවල සැබෑ ගැටළුවක් තෝරා ගෙන ඇත.<br><br>එම ගැටළුවට සුදුසු විසඳුම් නවෝත්පාදනයෙන් ඉදිරිපත් කර නැත. | නවෝත්පාදනය ආහාර හා පෝෂණය, ගෘහ කළමනාකරණය, රෙදිපිළි තාක්ෂණය හා ළමා සංවර්ධනය යන ගෘහ ආර්ථික විද්‍යාවේ ප්‍රධාන අංශයන්ට අදාල ව සිදු කරන ලද නිර්මාණයකි.<br><br>එකී ක්ෂේත්‍ර වල සැබෑ ගැටළුවක් තෝරා ගෙන නැත.<br>එම ගැටළුවට සුදුසු විසඳුම් නවෝත්පාදනයෙන් ඉදිරිපත් කර නැත. | නවෝත්පාදනය ආහාර හා පෝෂණය, ගෘහ කළමනාකරණය, රෙදිපිළි තාක්ෂණය හා ළමා සංවර්ධනය යන ගෘහ ආර්ථික විද්‍යාවේ ප්‍රධාන අංශයන්ට අදාළ ව සිදු කරන ලද නිර්මාණයක් නොවේ.<br><br>එකී ක්ෂේත්‍ර වල සැබෑ ගැටළුවක් තෝරා ගෙන නැත.<br>එම ගැටළුවට සුදුසු විසඳුම් නවෝත්පාදනයෙන් ඉදිරිපත් කර නැත. |
| ප්‍රායෝගිකභාවය හා සැබෑ ජීවිතයට ඇති වැදගත්කම | නවෝත්පාදනය ප්‍රායෝගික වේ.<br><br>බහුතරයකට ප්‍රයෝජනවත් වන නිර්මාණයකි.<br><br>දෛනික ජීවිතයට ගැළපෙන නිර්මාණයකි. | නවෝත්පාදනය ප්‍රායෝගික වේ.<br><br>බහුතරයකට ප්‍රයෝජනවත් වන නිර්මාණයකි.<br><br>දෛනික ජීවිතයට ගැළපෙන නිර්මාණයක් නොවේ. | නවෝත්පාදනය ප්‍රායෝගික වේ.<br><br>බහුතරයකට ප්‍රයෝජනවත් වන නිර්මාණයක් නොවේ.<br><br>දෛනික ජීවිතයට ගැළපෙන නිර්මාණයක් නොවේ. | නවෝත්පාදනය ප්‍රායෝගික නොවේ.<br><br>බහුතරයකට ප්‍රයෝජනවත් වන නිර්මාණයක් නොවේ.<br><br>දෛනික ජීවිතයට ගැළපෙන නිර්මාණයක් නොවේ. |
| දේශීය සම්පත් භාවිත කිරීමට හැකි වීම. | නවෝත්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් දේශීයව පහසුවෙන් සොයා ගත හැකි ඒවා වේ.<br><br>පරිසරයට හානි නොවන සම්පත් භාවිත කර ඇත.<br><br>භාවිත කර ඇති සම්පත් අඩු වියදමකින් ලබා ගත හැකි නවෝත්පාදනයක් වේ. | නවෝත්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් දේශීයව පහසුවෙන් සොයා ගත හැකි ඒවා වේ.<br><br>පරිසරයට හානි නොවන සම්පත් භාවිත කර ඇත.<br><br>භාවිත කර ඇති සම්පත් අඩු වියදමකින් ලබා ගත හැකි නවෝත්පාදනයක් නොවේ. | නවෝත්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් දේශීයව පහසුවෙන් සොයා ගත හැකි ඒවා වේ.<br><br>පරිසරයට හානි වන සම්පත් භාවිත කර ඇත.<br><br>භාවිත කර ඇති සම්පත් අඩු වියදමකින් ලබා ගත හැකි නවෝත්පාදනයක් නොවේ | නවෝත්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් දේශීයව පහසුවෙන් සොයා ගත හැකි ඒවා නොවේ.<br><br>පරිසරයට හානි වන සම්පත් භාවිත කර ඇත.<br><br>භාවිත කර ඇති සම්පත් අඩු වියදමකින් ලබා ගත හැකි නවෝත්පාදනයක් නොවේ. |
| ගැටළුව සඳහා විසඳුම් යෝජනා තිබීම. | නවෝත්පාදනය සඳහා ගැටළුවක් හඳුනාගෙන ඇත.<br>එම ගැටළුව සඳහා විසඳුම් යෝජනා නිර්මාණයෙන් ඉදිරිපත් වේ.<br><br>එම යෝජනා ප්‍රායෝගික වේ. | නවෝත්පාදනය සඳහා ගැටළුවක් හඳුනාගෙන ඇත.<br>එම ගැටළුව සඳහා විසඳුම් යෝජනා නිර්මාණයෙන් ඉදිරිපත් වේ.<br><br>එම යෝජනා ප්‍රායෝගික නොවේ. | නවෝත්පාදනය සඳහා ගැටළුවක් හඳුනාගෙන ඇත.<br>එම ගැටළුව සඳහා විසඳුම් යෝජනා නිර්මාණයෙන් ඉදිරිපත් නොවේ.<br><br>එම යෝජනා ප්‍රායෝගික නොවේ. | නවෝත්පාදනය සඳහා ගැටළුවක් හඳුනාගෙන නැත.<br>එම ගැටළුව සඳහා විසඳුම් යෝජනා නිර්මාණයෙන් ඉදිරිපත් නොවේ.<br><br>එම යෝජනා ප්‍රායෝගික නොවේ. |
| නිර්මාණශීලී ලෙස නවීන තාක්ෂණය භාවිත කර තිබීම. | නවෝත්පාදනය නවතම තාක්ෂණය භාවිත කර ඇත.<br>නිර්මාණශීලී සංකල්පයන් මත පදනම් වේ.<br><br>ආරක්ෂිත ලෙස සැලසුම් කළ නිර්මාණයකි. | නවෝත්පාදනය නවතම තාක්ෂණය භාවිත කර ඇත.<br>නිර්මාණශීලී සංකල්පයන් මත පදනම් වේ.<br><br>ආරක්ෂිත ලෙස සැලසුම් කළ නිර්මාණයක් නොවේ. | නවෝත්පාදනය නවතම තාක්ෂණය භාවිත කර ඇත.<br>නිර්මාණශීලී සංකල්පයන් මත පදනම් නොවේ.<br><br>ආරක්ෂිත ලෙස සැලසුම් කළ නිර්මාණයක් නොවේ. | නවෝත්පාදනය නවතම තාක්ෂණය භාවිත කර නැත.<br>නිර්මාණශීලී සංකල්පයන් මත පදනම් නොවේ.<br><br>ආරක්ෂිත ලෙස සැලසුම් කළ නිර්මාණයක් නොවේ. |